| ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| 07 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I | කාලය පැය 01 |

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. පෘථිවියේ සමක පරිධිය ලෙස සැලකෙන්නේ,
   I. 39 943 km කි. II. 40 077 km කි. III. 37 805 km කි. IV. 12 757 km කි.
2. ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ටාචාරය ආරම්භවූ ප්‍රදේශ ලෙෂ හැඳින්විය හැක්කේ,
   I. වියළි කලාපය II. තෙත් කලාපය III. කඳුකර කලාපය IV. වෙරළ කලාපය
3. වියළි කලාපයේ පිහිටි ශේෂ කඳු යටතට නොගැනෙන්නේ මින් කුමක්ද?
   I. කතරගම II. කොටපොල III. රිටිගල IV. දඹුල්ල
4. ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන මාර්ගයකි.
   I. සංවහන වර්ෂාව II. ඊසාන දිග මෝසම් වර්ෂාව III. වාසුළි වර්ෂාව IV.නිරිතදිගමෝසම් වර්ෂාව
5. ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපය ආශ්‍රිතව පිහිටා ඇති දූපතක් වන්නේ,
   I. මාලදිවයින II. ඩෙල්ෆ්ට් III. බහමාස් IV. හවායි

- පහත දැක්වෙන ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

6. අක්ෂාංශ හා දේශාංශ අනුව රටක පිහිටීම දැක්වීම .......................... (නිරපේක්ෂ / සාපේක්ෂ) පිහිටීම ලෙස හැඳින්වේ.

7. නිදහස් වෙළඳ කලාප හා කාර්මික ජනපද හේතුවෙන් ජනයා එකතු වී ඇත්තේ .......................... (තෙත් කලාපයේ / වියළි කලාපයේ) ය.

8.දකුණු ආසියාතික රටවල් අතුරින් මාතෘ මරණ අවම අගයක් ගන්නා රට වන්නේ .......................... (ශ්‍රී ලංකාව / මාලදිවයින) යි.

9.කඳුකර භූ දර්ශනයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ .......................... (තැනිතලා / සානු)

10. කොහු ආශ්‍රිත නිෂ්පාදන, හුණුගල් කර්මාන්තය වෙරළ ආශ්‍රිත .......................... (භෞතික භූ දර්ශනයේ / මානුෂ භූ දර්ශනයේ ) විශේෂ ලක්ෂණයකි.

- අංක 11-15 දක්වා දී ඇති ප්‍රකාශය නිවැරදි නම් ✓ ලකුණද වරදි නම් × වැරදි ලකුණ ද වරහන තුළ යොදන්න.

11. ජාත්‍යන්තර දින රේඛාව ලකුණු කර ඇත්තේ 180° දේශාංශ පදනම් කරගෙනය. ( )
12. මුහුදු මට්ටමේ සිට මීටර 100ට වඩා උසින් යුක්ත බිම්වල කඳුකර භූ දර්ශනය දැකිය හැකිය. ( )
13. ශ්‍රී ලංකාවට 65 610 $km^2$ ක් පමණ විශාල වූ භූමි ප්‍රමාණයක් අයත් වේ. ( )
14. චිරල් මුහුද පිහිටා ඇත්තේ ආසියා මහාද්වීපය තුළය. ( )
15. පෘථිවිය පූර්ණ ගෝලාකාර වස්තුවකි. ( )

- පහත දැක්වෙන සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

16. සිතියමෙහි **A** අක්ෂරයෙන් දක්වා ඇති කෝවිල වන්නේ,

    I. නල්ලූර් කෝවිල

    II. තිරු කෝනේෂ්වරම් කෝවිල

    III. මුන්නේෂ්වරම් කෝවිල

    IV. ස්කන්ධ කුමාර දේවාලය

17. සිතියමෙහි **C** අක්ෂරයෙන් දක්වා ඇති දූපත වන්නේ,

    I. ඩෙල්ෆ්ට් දූපත.

    II. කයිට්ස් දූපත.

    III. නයිනතිව් දූපත.

    IV. කච්චතිව් දූපත.

18. සිතියමෙහි **B** අක්ෂරයෙන් දක්වා ඇති භූ දර්ශන කලාපය වන්නේ,

    I. වියළි කලාපයයි.

    II. කඳුකර කලාපයයි.

    III. තෙත් කලාපයයි.

    IV. වෙරළ කලාපයයි.

19. සිතියමෙහි **D** අක්ෂරයෙන් දක්වා ඇති ඇත්තේ,

    I. තලවිල ශාන්ත ආනා දේවස්ථානය

    II. නාගදීපය

    III. මඩු දේවස්ථානය

    IV. නල්ලූර් කන්දසාමි කෝවිල

20. සිතියමෙහි **E** අක්ෂරයෙන් පෙන්වා ඇත්තේ,

    I. යාල වනෝද්‍යානය

    II. චන්ඩිකුලම් කුරුලු අභය භූමිය


    III. කොකාවිල් කුරුලු අභය භූමිය

    IV. විල්පත්තු වනෝද්‍යානය

| ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| 07 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව II | කාලය පැය 01 |

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. සිතියම **A.B.C.** යනුවෙන් ලකුණු කොට ඇති අක්ෂාංශ රේඛා නම් කරන්න.

**A -** ..................................................

**B -** ..................................................

**C -** ..................................................

II. පහත සාගර ප්‍රදේශ සිතියමෙහි ප්‍රදේශ සිතියමෙහි ලකුණු කරන්න.

**X-** දක්ෂිණ සාගරය

**Y-** ඉන්දියන් සාගරය

**Z-** අත්ලාන්තික් සාගරය

III. සිතියමේ **a.b.c.** අක්ෂර වලින් දක්වා ඇති මහාද්වීපය නම් කරන්න.

**a-** ..................................................

**b-** ..................................................

**c-** ..................................................

IV. පහත සඳහන් මුහුදු ප්‍රදේශ සිතියමෙහි ලකුණු කරන්න.

**P.-** ජපන් මුහුද

**Q.-** කැරිබියන් මුහුද

**R.-** බෝල්ටික් මුහුද

2. පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ප්‍රයෝජනයට ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. සිතියමෙහි ප්‍රධාන භූ විෂමතා කලාප දෙක ඇඳ නම් කරන්න.

II. පහත දැක්වෙන ස්ථාන සිතියමෙහි ලකුණු කර දක්වන්න.

A- පේදුරු තුඩුව

B- මන්නාරම් බොක්ක

C- මඩකලපුව

D- ත්‍රිකුණාමලය

III. සිතියමෙහි අංක වලින් දක්වා ඇති ස්ථාන නම් කරන්න.


IV. අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි ශේෂ කඳු දෙකක් ලකුණු කර නම් කරන්න.

V. පහත දැක්වෙන වනෝද්‍යාන සිතියමෙහි ලකුණු කරන්න.

X- යාල වනෝද්‍යානය

Y- විල්පත්තු වනෝද්‍යානය

Z- උඩවලව වනෝද්‍යානය




3. I. ශ්‍රී ලාංකික ජන සමාජය සෑදී ඇති ජන වර්ග කවරේද?

II. ශ්‍රී ලාංකිකයන් සතු ස්පෘශ්‍ය උරුම අතරින්,

**A-** මානව නිර්මිත 2ක් ලියන්න.


**B-** ස්වාභාවික නිර්මිත 2ක් ලියන්න.

III. පහත වගුවට අයත් **'A'** තීරුවේ ඒ ඒ ආගම්වලට අයත් උත්සව සඳහන් වේ. ආගමට ඉදිරියෙන් **'B'** තීරුවේ ඇති ආගමික උත්සව තෝරා ලියන්න.

| A | B |
|---|---|
| 1. බෞද්ධ ආගම | 1. වෙසක් උත්සවය |
| | 2. පාස්කු උත්සවය |
| 2. හින්දු ආගම | 3. දීපවාලි උත්සවය |
| | 4. හජ්ජි උත්සවය |
| 3.ක්‍රිස්තියානි ආගම | 5. රාමසාන් උත්සවය |
| | 6. ඇසළ උත්සවය |
| 4. ඉස්ලාම් ආගම | 7. මහා ශිව රාත්‍රී උත්සවය |
| | 8. තෛයිපොංගල් උත්සවය |
| | 9. නත්තල් උත්සවය |
| | 10. මිලා-උන්-නබි උත්සවය |

4. I. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම මොනවාද?

II. ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘතික සිතියමේ ඊතලවලින් වර්ෂාපතනය ලබාදෙන විධි තුනක් දක්වා ඇත. එම අක්ෂර පහත ලියා එම වර්ෂාපතන වර්ගයන් හා එය ලැබෙන කාල සීමාවන් ඒ ඉදිරියෙන් ලියන්න.




III. සංවහන වර්ෂාපතනය යනු කවරේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

5. I. ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු සීමාව යනු කවරේද?

II. පහත **'A'** තීරුවේ භූ දර්ශනයක් ද, **'B'** තීරුවේ භූ දර්ශන කලාපද සඳහන් වේ. ඔබ විසින් ඒ ඒ භූ දර්ශනයට අදාළ කලාපයේ අංකය වරහන තුළ යොදන්න.

| **'A'** (භූ දර්ශනය) | **'B'** (භූ දර්ශනය කලාපය) |
|---|---|
| 1. සමනළ කඳු වැටිය | 1. වෙරළ ආශ්‍රිත භූ දර්ශන කලාපය |
| 2. කයිට්ස් දූපත | 2. කඳුකර භූ දර්ශන කලාපය |
| 3. රිටිගල කඳු | 3. තෙත් කලාපීය භූ දර්ශන කලාපය |
| 4. කෝනේෂ්වරම් කෝවිල | 4. වියළි කලාපීය භූ දර්ශන කලාපය |
| 5. බියගම නිදහස් වෙළඳ කලාපය | 5. යාපන අර්ධද්වීපය හා අවට දූපත් ආශ්‍රිත භූ දර්ශන කලාපය |
| 6. නල්ලූර් කෝවිල | |
| 7. මන්නාරම් මඩු දේවස්ථානය | |
| 8. පාසිකුඩා වෙරළ තීරය | |

III. වෙරළාශ්‍රිත භූ දර්ශනය විදේශීය මෙන්ම දේශීය සංචාරකයන්ගේද චිත්තාකර්ෂණය දිනා ගැනීමට සමත්ව ඇත්තේ ඇයි?

6. I. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප මොනවාදැයි නම් කරන්න.

II. කඩොලාන ශාක වලින් ලැබිය හැකි ප්‍රයෝජන 4ක් ලියන්න.

III. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය දේශගුණයේම කොටසක් වන අර්ධ ශුෂ්ක දේශගුණ කලාපයේ වෘක්‍ෂලතා කෙබඳු ස්වරූපයක් ගන්නේද?

7. I. බටහිර දේශාංශ හා නැගෙනහිර දේශාංශ කෙටියෙන් හඳුන්වන්න.

II. ජාත්‍යන්තර දින රේඛාව ලකුණු කර ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

III. A. ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි දූපත් 3ක් නම් කරන්න.

B. මහාද්වීපය ආසන්නව පිහිටි මුහුදු 2ක් නම් කරන්න.